සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

මගේ අංකය / எனது இல / My No: DSD/HO/07/SD/08/01/AP/2022 06
ඔබේ අංකය / உமது இல / Your No: ..........................................
දිනය / திகதி / Date: 2022.02.28

සමෘද්ධි දෙපාර්. චක්‍රලේඛ අංක : 2022/05

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියලුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>සමෘද්ධි සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන - 2022</u>**

2030 වසර වන විට දුගී බවෙන් තොර, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වේ. ඒ අනුව 2022 අයවැය යෝජනා අනුව සමෘද්ධි ව්‍යාපාරය දිළිඳු සහන වැඩපිළිවලකට පමණක් සීමා නොවී ආර්ථික පුනර්ජීවනය ඇති කොට, ආහාර සුරක්ෂිතතාවය තහවුරු කර නූතන ප්‍රවනතා සමඟ බද්ධ වූ ග්‍රාම සංවර්ධන ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීම හා සමාජ සුභසාධන හා සහනධාර වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම වඩා තාර්කික හා විද්‍යාත්මක ක්‍රමවේදයක් මගින් සිදු කිරීම යන අරමුණු හා අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළ **"සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශණයේ"** සඳහන් සමාජ සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් 2022 වර්ෂයේ සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම පෙළගස්වා ඇත.

02. සමෘද්ධි හා අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ ජන ජීවිතය සංවර්ධනය කිරීම සඳහා බොහෝ ආර්ථික වැඩසටහන් ක්රියාවට නංවා ඇතත්, දිනෙන් දින වර්ධනය වන සමාජීය ගැටලු නිසා අපේක්ෂිත ඉලක්කයන් කරා ලඟාවීමට නොහැකි වී ඇත. ප්‍රජාවගේ සමාජීය ගැටලු වලට ආමන්ත්‍රණය කිරීම සඳහා බොහෝ ආයතනගත නිළධාරින් ග්‍රාමීය හා ප්‍රාදේශිය මට්ටමින් රාජකාරිවල නිරතව ඇතත්, ඔවුන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු නොකිරීම නිසා පොදුවේ ග්‍රාමීය ප්‍රජාව මුහුණ දෙන ගැටළුවලට තිරසාර විසඳුම් ලබා ගැනීමට නොහැකි වී ඇත.

එම අභියෝගය ජය ගැනීම සඳහා 2022 වර්ෂයේ සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය භාවිතා කර ඒකාබද්ධ සමාජ සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත. ඒ අනුව 2019 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරූ සමාජ

සංවර්ධන සහකාරුවන් මගින් ගම්මාන 150 ක් සංවර්ධනය කිරීමට අදහස් කර ඇත. එම ගම්මාන තුළින් හඳුනා ගන්නා ආර්ථික හා සමාජීය ගැටළුවලට තිරසර විසඳුම් ලැබෙන ආකාරයට සමස්ථ වැඩසටහනම පෙළගස්වා ඇත.

3. ඒ අනුව 2022 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සමාජ සංවර්ධන වැඩසටහන් පහත දක්වා ඇත. එක් එක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ඇමුණුම් අංක 1 සිට 7 ලෙස දක්වා ඇති අතර එක් එක් වැඩසටහන සඳහා දිස්ත්‍රික් මට්ටමින් කාර්තුමය වශයෙන් වෙන්වන ප්‍රතිපාදන පිළිබඳ විස්තර ඇමුණුම් අංක 8,9,10 දක්වා ඇත. ඒ අනුව ඉහත ඉලක්කයන් කාර්තුමය වශයෙන් සාධනය කරගත හැකි ආකාරයෙන් ඔබ දිස්ත්‍රික්කයේ සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන් සැලසුම් කරගත යුතුය.

| | | |
|---|---|---|
| 1 | සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය භාවිතා කර ඒකාබද්ධ සමාජ සංවර්ධන වැඩසසටහනක් ක්‍රියාත්මක කිරිම | ඇමුණුම 01 |
| 2 | දිරිය පියස නිවාස වැඩසටහන | ඇමුණුම 02 |
| 3 | මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය, ගෘහ කළමනාකරණය හා සතුටු පවුල් වැඩසටහන | ඇමුණුම 03 |
| 4 | සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල කායික හා මානසික ගැටළු අවම කිරීමේ වැඩසටහන | ඇමුණුම 04 |
| 5 | බෝනොවන රෝග අවම කිරිම සඳහා කාබනික ආහාර ප්‍රවර්ධන වැඩසටහන | ඇමුණුම 05 |
| 6 | සනිපාරක්ෂක පහසුකම් සැපයීමේ වැඩසටහන | ඇමුණුම 06 |
| 7 | සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍යය වැඩසටහන | ඇමුණුම 07 |

05. ඉහත වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක වේද යන්න මැන බැලීමටත්, ගැටළු සමාලෝචනය තුළින් නව යෝජනා ඉදිරිපත් කිරීමටත්, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ප්‍රගති සමාලෝචනය සිදු කිරීමටත් අපේක්ෂා කෙරේ. ඒ අනුව දිස්ත්‍රික් මට්ටමින් මාසිකව පැවැත්වෙන මූලස්ථාන සමෘද්ධි කළමනාකරුවන්ගේ ප්‍රගති සමාලෝචන වැඩමුළුවේ දී ප්‍රගතිය සාකච්ඡා කිරීම කළ යුතුය. සමාජ සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය පුළුල් ලෙස කාර්තුමය වශයෙන් සාකච්ඡා කිරීම සඳහා පමණක් කාර්තුවකට එක් වැඩසටහන බැගින් වන සේ වැඩසටහන් 04 ක් සඳහා ප්‍රතිපාදන ලබාදීමට අපේක්ෂිතය.

**ප්‍රාදේශීය මට්ටම** - සියලුම වසම් ආවරණය වන පරිදි සෑම මසකම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රගති වැඩමුළු පැවැත්වීම හා ප්‍රගතිය දිස්ත්‍රික් මට්ටමට ලබාදීම.

**දිස්ත්‍රික් මට්ටම** - දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ මූලස්ථාන කළමනාකරුවන් හා සමාජ සංවර්ධන සහකාරවරුන්ගේ සහභාගිත්වයෙන් කාර්තුවකට එක් වැඩසටහනක් පැවැත්විය යුතුය .

**ජාතික මට්ටම** - දිස්ත්‍රික් සමාජ සංවර්ධන කළමනාකරුවන්ගේ හා ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන අංශයේ නිළධාරින්ගේ සහභාගිත්වයෙන් කාර්තුවකට එක් ප්‍රගති සමාලෝචන රැස්වීමට පැවැත්වීමට කටයුතු කෙරේ.

06. ඉහත සමස්ථ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දි අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු බව වැඩිදුරටත් දන්වමි. දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය සෑම මසකම 05 දිනට පෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබාගෙන ඇමුණුම් අංක 9 හා 10 A, B අනුව සමෘද්ධි සමාජ සංවර්ධන අංශය වෙත සෑම මසකම 10 දිනට පෙර එවිය යුතුය.

07. කඩිනමින් තොරතුරු යොමු කිරීම සඳහා socialdev@divineguma.gov.lk විද්‍යුත් ලිපිනය හෝ 0112-889005 දරණ ෆැක්ස් අංකය ද භාවිත කළ හැකිය. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩි විස්තර 0112-889005, 0112-876601 දුරකතන අංක වලට සමාජ සංවර්ධන අංශය ඇමතීමෙන් ලබාගත හැකිය.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයං රැකියා , ව්‍යාපර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
02. අතිරේක ලේකම්(සමෘද්ධි), - එම - - කා.දැ.ගැ.ස
03. විගණන අධිකාරී, රජයේ විගණන අංශය - කා.දැ.ගැ.ස.
04. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
06. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.